පුවත් ගොනුව

ශ්‍රී ලංකාව

# වෛද්‍ය නීති ආයතනවලට ආධාර

2022 ජනවාරි




**ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ආසාදන නිවාරණ සහ පාලන ඒකාබද්ධ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කරන ලද මෘත ශරීරාගාර 17 ක් සඳහා සනීපාරක්ෂක සහ විෂබීජ නාශක ද්‍රව්‍ය, පුද්ගල ආරක්ෂණ උපකරණ සහ මියගිය තැනැත්තන් කළමනාකරණයට අවශ්‍ය ද්‍රව්‍ය සපයන ලදී. සුළු අලුත්වැඩියාවන් සහ ද්‍රව්‍යාධාර සැපයීමෙන් ප්‍රයෝජන අත්වන නිර්දේශිත මෘත ශරීරාගාරවලදී ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය සමගින් ඒකාබද්ධ ඇගයීම් පවත්වන ලදී.**

ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ආධාර ඇතිව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය, ආසාදන නිවාරණ සහ පාලන ඒකාබද්ධ ව්‍යාපෘතිය යටතේ තෝරා ගන්නා ලද හලාවත සහ මඩකලපුවේ මෘත ශරීරාගාර දෙකකට සම්පූර්ණ ආධාර ලබාදී එම කාර්ය අධීක්ෂණය කරයි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ මෘත ශරීරාගාරවලට කෝවිඩ්-19 වසංගතය නිසා පැන නැගී ඇති අභියෝග හමුවේ සුරක්ෂිතව ඒවායේ මෙහෙයුම් අඛණ්ඩව සිදුකරගෙනයාමට ආධාර කිරීමයි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව කොළඹ අධිකරණ වෛද්‍ය සහ විෂවේද ආයතනයට එහි මධ්‍යගත ලේඛනාගාරයේ ප්‍රයෝජනය පිණිස වානේ ගබඩාකිරීම් පහසුකම් ඒකක 20 ක් ද සැපයීය. හිමිකම් නොකී සහ හඳුනා නොගත් මෘතදේහවලට අදාළ තොරතුරු අනාගත යොමුව පිණිස ක්‍රමානුකූලව සංරක්ෂණය කිරීමට වගබලාගනිමින්, පිළිගත් ප්‍රශස්ත පිළිවෙත් අනුව තොරතුරු කළමනාකරණය සහ ආරක්ෂාකිරීම උදෙසා මෙම ආරම්භණය දායකවෙයි.

ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී, කෝවිඩ්-19 වසංගතය නිසා සිදුවන මරණවලදී මෘතදේහ කළමනාකරණය පිණිස ආධාර කිරීමක් ලෙස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශයට මළසිරුරු බහාලන කවර 2000 ක් පරිත්‍යාග කළේය.

# පොලිස් සේවය සඳහා ජාත්‍යන්තර රීති සහ ප්‍රමිති පිළිබඳ පුහුණු සැසි




නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් සඳහා ජාත්‍යන්තර නීති ප්‍රමිති මැයෙන් පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ සේවානියුක්තිකයන් වෙනුවෙන් ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා පුහුණු සැසි පවත්වන ලදි. එම නිලධාරීන්ගේ සම්මුඛ සහභාගිත්වය ඇතිව සහ මාර්ගගත ක්‍රමයට සංවිධානය කරන ලද මෙම පුහුණු සැසි පැවැත්වීමේ අරමුණ වූයේ අධිකරණ ඇපකර ක්‍රියාවලිය, හිංසා සහගත ලෙස සැලකීම හා වදහිංසාවන්ට ලක්කිරීම, අත්අඩංගුවට ගැනීම හා රඳවා ගැනීම, බලය සහ ගිනිඅවි භාවිතය, සෝදිසිකිරීම හා භාරයට ගැනීම සහ මහජන සාමය කළමනාකරණය පිළිබඳ මෙම නිලධාරීන්ගේ දැනුම හා අවබෝධය වර්ධනය කිරීමයි.

මෙම පුහුණු සැසිවලට අලුතින් බඳවා ගන්නා ලද පොලිස් නිලධාරීන්, විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් මෙන්ම විශේෂ කාර්ය බලකායේ විශේෂ අවි සහ උපක්‍රම කණ්ඩායම, වෛද්‍ය ඒකක කාර්ය මණ්ඩලය, අලුතින් උසස් කරන ලද ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් සහ ශ්‍රී ලංකාවේ සියලුම පොලිස් අභ්‍යාස විද්‍යාලවල උපදේශකවරුන් ඇතුළු 4500 කට වැඩි පිරිසක් සහභාගි වූහ.

# අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වලට දුරස්ථ ක්‍රමයෙන් මනෝසමාජීය ආධාර




කෝවිඩ්-19 වසංගතය නිසා උද්ගත වූ අභියෝග මධ්‍යයේ අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වලට අඛණ්ඩව උපකාර කිරීම පිණිස, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ කොළඹ පිහිටි මානසික සෞඛ්‍ය සහ මනෝසමාජීය ආධාර වැඩසටහන දුරස්ථ ක්‍රමය උපයෝගි කරගත්තේය. දේශීය හවුල්කාර සංවිධාන සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් පුහුණුකරන ලද සහායකයන් සමග එක්ව කටයුතු කරමින් ස්කයිප් තාක්‍ෂණය සහ දුරකථන මාර්ගයෙන් අදාළ පවුල්වෙත ප්‍රවේශවිය.

ඇතැම් අවස්ථාවලදී අතථ්‍ය සංනිවේදන ක්‍රම භාවිතය අභියෝගාත්මක වූවත්, ප්‍රජා හැඟීමෙන් සහ විශ්වාසදායි සම්බන්ධතා සමගින් සහායකයන්ට පවුල් සමග මනා සබැඳියාවක් ගොඩනගා ගැනීමට හැකිවිය. මේ ආකාරයෙන් 2021 වසරේදී මඩකලපුව, ගම්පහ සහ යාපනයේ දී සහායකයන් සහ පවුල් අතර තනිපුද්ගල සැසි 6,246 ක් පැවැත්වීමට හැකි විය. තම අතුරුදහන්වූ ප්‍රියාදරයන් සිහිවීම පිණිස ව්‍යාපෘතිවල හෝ ක්‍රියාකාරකම්වල නිරතවීමටද අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වලට ආධාර පිරිනැමීය.

අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වලට තමන්ගේ සංකීර්ණ මානසික තත්වයට දුෂ්කරතා මධ්‍යයේ සාර්ථකව මුහුණදීමට සහායකයන් සැපයූ මගපෙන්වීම බෙහෙවින් උපකාරීවෙයි. බොහෝ පවුල් සහායකයන් සලකන්නේ තම අදහස් පළකිරීමට ඔවුන්ට යලිත් අවස්ථාවක් ලබාදුන් "මිතුරන්" ලෙසයි. මෙම පවුල් මෙම අභියෝගාත්මක කාලපරිච්ජේදය තුළදී දුරස්ථ ක්‍රමය ඔස්සේ සැපයූ ආධාර අගය කරති.

කෝවිඩ් - 19 වසංගතය නිසා ඇතිවූ ආර්ථික අභියෝගවලට සාර්ථකව මුහුණදීමට උදව්කිරීමක් ලෙස අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වලට හදිසි සහන වැඩසටහන මගින් විවිධ අවශ්‍යතා සපුරාගැනීමට මූල්‍ය ආධාර ද ලැබිණි. මෙම වැඩසටහන මාර්ගයෙන් මේ දක්වා අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල් 2600 කට ආධාර සපයා ඇත.

*"මගේ මානසික අරගල අවබෝධ කරගත් සහ මගේ හිතේ ඇතිවන හැඟීම් ඉතා විවෘතව ප්‍රකාශ කිරීමට හැකි කෙනෙකුට කතාකිරීමට මට හැකිවීම ගැන මා මහත් සේ සතුටුවෙනවා" මට මානසික සහනයක් දැනුනා"-*

ගම්පහ දිස්ත්‍රික්කයේ අතුරුදහන් වූ තැනැත්තෙකුගේ භාර්යාව

# යුධ රීති පිළිබඳව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව පැවැත්වූ ගෝලීය වැඩමුළුවට ශ්‍රී ලංකාවෙන් ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීහු සහභාගිවෙති




2021 නොවැම්බර් 1 දා සිට 4 දා දක්වා පැවති හමුදා මෙහෙයුම් පාලනය කෙරෙන ජාත්‍යන්තර නීති පිළිබඳ 14 වැනි ජාත්‍යන්තර වාර්ෂික ජ්‍යෙෂ්ඨ වැඩමුළුවට (SWIRMO) ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් 6 දෙනෙකුට සහභාගිවීම පිණිස ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව පහසුකම් සැලසීය. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ ඉහළ පෙළේ වැඩමුළුවක් වන මෙම වැඩමුළුව අවධානය යොමුකරන්නේ හමුදා මෙහෙයුම් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ අදාළත්වය කෙරෙහිය.

මෙම වසරේදී වැඩමුළුවේ අවධානය යොමු කරන ලද්දේ නාගරික යුද සටන්, හවුල් හමුදා මෙහෙයුම් සහ සංග්‍රාම භූමියේ හැසිරීමට බලපාන දේ පිළිබඳ ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ භූමිකාව කෙරෙහිය. සහභාගිවන්නන්ට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව නිර්මාණය කළ නව වීඩියෝ ක්‍රීඩා සමාකරණයක් භාවිත කිරීමටද අවස්ථාව ලැබුණු අතර එමගින් සිවිල් වැසියන්ට හානි සිදුවීමේ අවදානමට එරෙහිව හමුදා අරමුණු සමතුලිත කරගැනීමේ අවශ්‍යතාව ඇති සැබෑ ජීවිතයට සමාන දර්ශනවලට නිලධාරීහු සහ සෙබළු යොමුකරනු ලැබූහ.

ශ්‍රී ලංකාවෙන් සහභාගිවූ කණ්ඩායමට හමුදා සහ සංනිවේදන තාක්ෂණයන්හි දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස යුද්ධවලදී වෙනස්වන සංදර්භය තුළ ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ න්‍යායන් සහ රීති භාවිතය ගැන පැහැදිලි කිරීමක් සිදුවිය.

මෙම වැඩමුළුව ගැන අදහස් පළ කළ ශ්‍රී ලංකාවෙන් සහභාගි වූ එක් හමුදා නිලධාරියෙකු පැවසුවේ "වෙනත් රටවලින් සහභාගිවූ නිලධාරීන් සමග ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ගැන අපගේ සිතුවිලි සහ අදහස් හුවමාරු කරගැනීමට මෙම වැඩමුළුව අපට වේදිකාවක් විය. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය අදාළවන්නේ යුද්ධෝපාය තලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට පමණක් නොවේ. එම දැනුම, විධානයේ සෑම තලයකටම ලබාදිය යුතු අතර එවිට සියලුම පාර්ශවකරුවන් එහි අදාළත්වය ගැන අවබෝධයෙන් පසුවනු ඇත. ලොව පුරා සන්නද්ධ හමුදා ජාත්‍යන්තර මානුෂවාදී නීතියට ගරුකිරීම ප්‍රවර්ධනය කිරීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ඉටුකරන කාර්යභාරය ප්‍රශංසනීයයි."

හමුදා මෙහෙයුම් පාලනය කෙරෙන ජාත්‍යන්තර නීති පිළිබඳ 14 වැනි ජාත්‍යන්තර වාර්ෂික ජ්‍යෙෂ්ඨ වැඩමුළුවට රටවල් 90 කට වැඩි සංඛ්‍යාවකින් ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීහු 400 ක් මාර්ගගත සාකච්ඡා ක්‍රමවේදය සහ සම්මුඛව සැසිවලට සහභාගිවූහ. මෙහෙයුම් පරිචයට ජාත්‍යන්තරව සැලකිල්ල දක්වන නෛතික කරුණු ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව පිලිගනිමින් ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ ඉතා වැදගත් අංග සම්බන්ධයෙන් ගැඹුරු අවබෝධයක් ලබාගැනීමට මෙම වැඩමුළුවට සහභාගිවූ නිලධාරීන්ට හැකිවිය.

## තොරතුරු සහ දත්ත

2021 සැප්තැම්බර් - දෙසැම්බර්

### අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

- අතුරුදහන්වූ තැනැත්තන්ගේ ඥාතීන් 650 දෙනෙකුට දුරස්ථ සැසි 2,988 ක් මාර්ගයෙන් සතිපතා මනෝසමාජීය ආධාර ලැබුණු අතර ඉන් 117 දෙනෙක් ආර්ථික, නෛතික හා පරිපාලන, අධ්‍යාපන සහ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා උපකාර ලබාගැනීම පිණිස සේවා සැපයුම් ආයතන වෙත යොමුකරනු ලැබූහ;
- ක්ෂුද්‍ර ආර්ථික වැඩසටහන මාර්ගයෙන් ආදායම් උත්පාදනයට ඔවුන්ට ඇති ප්‍රවේශය වැඩිදියුණු කරගැනීම සඳහා පවුල් 129 කට මුදල් ප්‍රදාන සැපයිය;
- කෘෂි කර්ම සහ ධීවර ක්ෂේත්‍රවල පවුල් 1,550 කට ආදායම් උත්පාදනයට ඔවුන්ට ඇති ප්‍රවේශය වැඩිදියුණු කරගැනීම සඳහා මුදල් සහ යෙදවුම් ආධාර ලැබිණ;
- කෝවිඩ්-19 ට ආදාළව ගත් ක්‍රියා මාර්ග හේතුවෙන් පීඩාවට පත් පවුල් 171 කට ජීවනෝපාය ව්‍යාපෘති යළි සක්‍රිය කරගැනීම පිණිස අතිරේක ආධාර ලැබුණු අතර පවුල් 2,812 කට හදිසි සහන වැඩසටහනෙන් බහු කාර්ය මුදල් ආධාර ලැබිණ.

### අධිකරණ වෛද්‍ය ධාරිතා ශක්තිමත් කිරීම

- මානව විද්‍යා වාත්තු 26 ක්, මානව විද්‍යා උපකරණ 2 ක් සහ අධිකරණ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත විද්‍යාත්මක ආශ්‍රේය ප්‍රාකාශන 21 ක් යාපනය විශ්ව විද්‍යාලයට ප්‍රදානය කරන ලදී;
- හලාවත දිස්ත්‍රික්ක මහ රෝහලට, මඩකලපුව ශික්ෂණ රෝහලට සහ අධිකරණ වෛද්‍ය සහ විෂවේද ආයතනය වෙත වෛද්‍ය උපකරණ සමග පවිත්‍රකාරක, විෂබීජනාශක ද්‍රව්‍ය සහ උපකරණ ප්‍රදානය කරන ලදී;
- "හිමිකම් නොකී සහ හඳුනානොගත් මෘත ශරීර කළමනාකරණයට" අදාළ භාවිත මාර්ගෝපදේශ පිටපත් 500 ක් මුද්‍රණය කර අධිකරණ වෛද්‍ය සහ විෂවේද ආයතනය වෙත ප්‍රදානය කරන ලදී;
- සහභාගිවන්නන් 41 දෙනෙකු වෙනුවෙන් ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය විසින් මෙහෙයවන ලද අධිකරණ වෛද්‍ය මානව විද්‍යා පූර්ව සම්මේලන සැසියට ආධාර සපයන ලදී.

Continued on Page 4 

Continued from Page 3

## රැඳවුම් තත්වයන් නිරීක්ෂණය කිරීම

- ශ්‍රී ලංකාවේ රැඳවුම් ස්ථානවලදී රැඳවියන් 299 දෙනෙකු වෙන් වෙන් වශයෙන් හමුවූ අතර සොයාගත් කරුණු සහ නිර්දේශ බන්ධනාගාර බලධාරීන් සමග රහස්‍යමය ලෙස හුවමාරු කරගන්නා ලදී:
- රැඳවුම් ස්ථානවලට ගොස් තම ඥාතීන් හමුවීම පිණිස පවුල් 222 කට ගමන් වියදම් දීමනාවක් ලබාදෙන ලදී:
- රැඳවුම් මධ්‍යස්ථාන 7කට සනීපාරක්ෂක සහ විනෝදාස්වාදය දෙන අයිතම යථායෝග්‍ය පරිදි සපයන ලද අතර එයින් රැඳවියන් 5,264 දෙනෙකුට ප්‍රතිලාභ අත්විය:
- බන්ධනාගාර මූලස්ථානයට සහ වැලිකඩ  බන්ධනාගාර රෝහලට පුද්ගල ආරක්ෂණ උපකරණ පරිත්‍යාග කරමින් බන්ධනාගාරවල කෝවිඩ්-19 පැතිරීම  වැලැක්වීමට සහ පාලනයට උපකාර කිරීමට බන්ධනාගාර සෞඛ්‍ය බලධාරීන් සමග කටයුතු කළේය. මෙම අයිතම ආරක්ෂණ උපකරණ 19600 ක් සහ දියර සබන් හා විෂබීජ නාශක ද්‍රව්‍ය ලීටර් 330 කින් සමන්විත විය:
- අණ්වීක්ෂ කදාවන් 100 ක්, වර්ණකරණ ලද කදා 50 ක්, අණ්වීක්ෂ කදාවන් සඳහා භාවිතා කරන කවර 1000 ක්, කේන්ද්‍රාපසාරකය, රුධිර විශ්ලේෂකය සහ පරීක්ෂණ නළ තැබීමට රාක්කයක් ඇතුළු රසායනාගාර උපකරණ මහර බන්ධනාගාර රෝහලට පරිත්‍යාග කරන ලදී.

## මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීම

- හෙන්රි ඩුනාන්ට් අනුස්මරණ වාද උසාවි තරඟාවලියේ අතථ්‍ය ජාතික වටයට සහභාගිවන ලෙස විශ්ව විද්‍යාල සහ නීති විද්‍යාලයට ආරාධනය කරන ලදී. දෙසැම්බර් 23 දා පවත්වන ලද අවසන් තරඟයේදී කොළඹ විශ්වවිද්‍යාල කණ්ඩායම ශූරයන් ලෙස ජය ලැබීය:
- අග්නිදිග ආසියා රටවල් සඳහා නොවැම්බර් 1 දා සිට 4 දා දක්වා පවත්වන ලද හමුදා මෙහෙයුම් පාලනය කෙරෙන ජාත්‍යන්තර නීති පිළිබඳ ජ්‍යෙෂ්ඨ වැඩමුළුවේ අතථ්‍ය පාඨමාලාවට ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීහු 6 දෙනෙක් සහභාගිවූහ:
- අභ්‍යන්තර ආරක්ෂක මෙහෙයුම්වලදී යුද්ධ හමුදාව මැයෙන් පැවත්වූ වැඩමුළුවට සහභාගිවීමට යුද්ධ හමුදාවේ නිලධාරීන් 108 දෙනෙකුට අවස්ථාව ලැබිණ:
- ජාත්‍යන්තර නීති සහ ප්‍රමිති මැයෙන් නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් සඳහා මාර්ග ගත ක්‍රමයට පැවැත්වූ පුහුණු සැසි 7 කට සහ පෞද්ගලික සහභාගිත්වය ඇතිව පවත්වන  ලද පුහුණු සැසි 2 කට විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් ඇතුළු පොලිසියේ 4500 කට වැඩි පිරිසක් සහභාගි වූහ.

## ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ආධාර ලබාදීම

- කෝවිඩ්-19 පැතිරීම  වැලැක්වීමේ පියවරක් ලෙස දිස්ත්‍රික්ක 6 ක ප්‍රසිද්ධ ස්ථාන 488 ක විෂබීජහරණය කරන ලදී:
- දිස්ත්‍රික්ක 4 ක ස්වේච්ඡා සේවකයන් 107 දෙනෙකුට ආපදා ප්‍රතිචාර ශිල්ප ක්‍රම පිලිබඳ පුහුණුව ලබාදෙන ලදී:
- අපේක්ෂකයෝ 78 දෙනෙක් උසස් ප්‍රථමාධාර පුහුණුවට සහභාගි වූහ:
- මානුෂවාදී ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානය පිළිබඳ සැසි 13 ක් සංවිධානය කරන ලදී:
- ආපදා අවස්ථාවලදී මානුෂවාදී අවශ්‍යතා කළමනාකරණය කෙරෙහි අවධානය යොමුකරමින් ශ්‍රී ලංකා රතු කුරුස සමාජය යුද්ධ හමුදාවේ 100 දෙනෙකුට කඳවුරු කළමනාකරණය ගැන පුහුණුව ලබාදුන්නේය:
- සුරක්ෂිත ප්‍රවේශය ගැන දැනුම අලුත් කිරීමේ වාර්ෂික වැඩමුළුවට 43 දෙනෙක් සහභාගිවූහ : සුරක්ෂිත ප්‍රවේශය පිළිබඳව ස්වේච්ඡා සේවකයන් දැනුවත් කිරීමේ සැසි 25 ක් දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වන ලදී.

**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (11) 250 33 46
ෆැක්ස්: +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ්: www.icrc.org

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර
පිල්ලයාරඩි මඩකලපුව
දුරකථන: +94 (0)65 222 70 70

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර,
වයිරවර්පුලියන්කුලම්, වව්නියාව
දුරකථන: +94 (0)24 222 28 55
ෆැක්ස්: +94 (0)24 222 25 37

මුල් පිටුවේ ඡායාරූපය කෝනමලායි/ICRC
© ICRC, ජනවාරි 2022

facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc

ICRC

1818/259 01.2022